# අපූරු යාළුවෝ



පියුමංසි උමායා මාපාබණ්ඩාර

# අපූරු යාළුවෝ...........



පියුමංසි උමායා මාපාබණ්ඩාර

**ISBN –**

කෘතිය පළ කරන දිනය – **2023.11.15**

කතෘගේ වෙනත් කෘතීන් – ඔයාව කවදාවත් අමතක වෙන්නෙ නැහැ

පැණි පුහුල් ගෙඩිය

# පිදුම

**දිවා රෑ වෙහෙසී මගේ අනාගතය වෙනුවෙන් ඇප කැප වන මගේ ආදරණීය අම්මාට, අප්පච්චීට, සහ මා පුංචි කාලයේ සිට රැක බලාගත් කිරිඅම්මාට, කිරිඅත්තාට සහ මෙම පොත ලිවීමට උනන්දු කර වූ අපේ ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ට සහ අපට පළමු වසරේ සිට දෙවන වසර දක්වා පංති භාරව සිටි අපගේ ආදරණීය ගයනි ගුරු මෑණියන්ටත්, ලහිරු ගුරු මෑණියන්ටත්, සමින්ද ගුරු පියාණන්ට සහ මගේ පංතියේ සියලු ම මිතුරියන්ට පිළිගන්වමි.**

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මහ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරිමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

2023.11.01



"හා... හා... යාළුවේ මොකද අද උදේම?"

වඳුරු පැංචා වලස් පැංචා ගෙන් ඇසුවේය.

"අනේ යාළුවේ, මගේ කකුලේ කට්ටක් ඇනිලා. ඇවිද ගන්නවත් බැහැ. මම මේ හිමින් හිමින් කෑමට මොනවත් සොයා ගන්න යනවා... දවස් ගානකින් මොනවත් කාලත් නැහැ." වලස් පැංචා පිළිතුරු වශයෙන් එසේ කිව්වේය.

"පොඩ්ඩක් ඔහොම ඉන්නකෝ. මම ඔයාට අඹ කඩලා දෙන්නම්." වඳුරු පැංචා වලස් පැංචාට කිව්වේය.

"යාළුවේ ඔයාට ගොඩක් ස්තූතියි." වලස් පැංචා වඳුරු පැංචා ට ස්තුති කළේය.



"අනේ ඕක සුළු දෙයක්නෙ. කෙනෙකුට විපතක් වුණාම උදව් කරන එක හොඳ සිරිතක්නෙ." වලස් පැංචා අඹත් අරගෙන වඳුරු පැංචාට ස්තුති කරලා යන්න ගියේය.

ටික දවසකට පස්සෙ වලස් පැංචා කැලේ මැදින් යනකොට කෑ ගහන සද්දයක් ඇසුණා.




"අයියෝ... අනේ මාව බේරා ගන්න කවුරුත් නැති දෝ... අනේ මාව බේරාගන්න." කියලා මහ හඬින් කෑ ගහන වඳුරු පැංචා දැකපු වලස් පැංචා ට හොඳටම දුක හිතුණා.

"එදා මට බඩගිනි වෙලා හිටපු වෙලාවෙ අඹ කඩලා ගෙනත් දුන්න වඳුරු පැංචා ට උදව් කරන්න හොඳම වෙලාව." කියලා වලස් පැංචා හිතුවා.

" යාළුවේ, ඔහොම ඉන්නකෝ. ඔයා බයවෙන්න එපා. මම ඔයාව බේරා ගන්නවා." කියලා වලස් පැංචා වඳුරු පැංචා ට කිව්වේය.



වලස් පැංචා හනිකට වඳුරු පැංචා ළඟට ගිහින් පැටලිලා හිටිය උගුලෙ ලණු පටවල් කපලා දැම්මා. වඳුරු පැංචා ට හරිම සතුටුයි.

"අනේ ඔයාට ගොඩක් ස්තුතියි. මේ කරපු උදව්වට." වඳුරු පැංචා වලස් පැංචා ට කිව්වේය.

"අයියෝ ඒක මොකක්ද? එදා ඔයත් මට උදව් කළානේ. මට ඒ උදව්ව අමතක නැහැ." වලස් පැංචා කිව්වේය. එතැන් පටන් වලස් පැංචායි, වඳුරු පැංචායි හොඳම යාළුවෝ වුණා.

පුංචි යාළුවනේ, අපිට මේ කතාවෙන් ගන්න පුළුවන් ආදර්ශය තමයි "යමෙකුට කරදරයක් විපතක් උනාම උදව් කරන එක හොඳ සිරිතක්. ඒ වගේම කළගුණ අමතක නොකරන එකත් හොඳ සිරිතක්."

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු....

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01